ලේඛකාධිකාරී
මහනුවර දිසා ශාසනාරක්ෂක බලමණ්ඩලය
Secretory
Authoritative Board for the Upliftment of Buddhist Affairs, Kandy District,
Secretariat Office, Kandy, Sri Lanka

Aggamaha Saddhamma Jotika Dhaja
Senior Professor
**Gallelle Sumanasiri Thero**
Chairman,
Authoritative Board for the
Upliftment of Buddhist Affairs
Poojapitiya Secretariat Division

Former Vice Chancellor
Buddhist and Pali University of Sri Lanka

Chief Incumbent of
Kotamudungala Rajamaha Viharaya,
Molagoda, Harankahawa,
Sri Lanka.

මහනුවර දිසා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ
ලේඛකාධිකාරී

පූජාපිටිය ශාසනාරක්ෂක බලමණ්ඩලයේ
සභාපති

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙහි
හිටපු උප කුලපති, අග්ගමහා සද්ධම්ම ජෝතික ධජ,
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
**ආචාර්ය ගල්ලෑල්ලේ සුමනසිරි ස්ථවිර**
විහාරාධිපති
රජමහා විහාරය, මොලගොඩ,
හරන්කහව
Email : pansalamola@gmail.com


2025. 02. 20

ගරු ජනාධිපති ලේකම් නන්දික සනත් කුමානායක මහතා

ජනාධිපති ලේකම් කාර්යාලය

කොළඹ 01.

**මා වෙත ප්‍රදානය කරන ලද රජරට විශ්වවිද්‍යාලයේ කුලපති ධුරයෙන් ඉල්ලා අස්වීම යි**

2025 පෙබරවාරි මස 10 වෙනි දින ඔබතුමා විසින් මා වෙත ප්‍රදානය කරන ලද රජරට විශ්වවිද්‍යාලයේ කුලපති ධුරය මම ඉතා සතුටින් භාරගත් බව දන්වා සිටිමි. ඒ පිළිබඳව මාධ්‍යයන්හි ප්‍රසිද්ධවීමත් සමග බොහෝ ප්‍රශංසා, සුබපැතුම් මා වෙත ලැබෙන්නට විය. තත් ධුරය සඳහා මාගේ ප්‍රාමාණික සුදුසුකම පිළිබඳව මහනායක, අනුනායක මාහිමිපාණන් වහන්සේලා මෙන්ම අන්‍ය පූජකතුමන්ලාගෙන්ද, දෙස් විදෙස් බොහෝ දෙනෙකුගෙන්ද ප්‍රසාදජනක සුබපැතුම් මා වෙත ලැබුණි.

විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ දිඝී කාලයක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරෙ සිට ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර දක්වා සිදු කොට ඇති ශාස්ත්‍රීය සේවාව ද අංශාධිපති, පීඨාධිපති තත්වයේ සිට උප කුලපති තනතුර දක්වා ලබා ඇති පරිපාලන කුශලාතාවයන් ද දේශිය හා විදේශිය භාෂා ප්‍රවිනතාවයන් ද ජාතික හා ජාත්‍යන්තරව අත්කර ගෙන ඇති කීර්තිය ද අතිශය සම්භාවනීය වූ කුලපති තනතුරක් හෙබවීමට මා සාකල්‍යයෙන්ම සුදුසුවන බවට සාධක වෙති. තත් කරුණු සැළකිල්ට ගෙන මා වෙත කුලපති තනතුරකින් පිදුම් ලැබීම පිළිබඳව මගේ ස්තුතිය ප්‍රකාශ කරනු කැමැත්තෙමි.,

ඉහත කරුණු එසේ වුවද, මින් පෙර මෙම ධුරය දැරූ ස්වාමීන් වහන්සේ මෙකී ධුරය නැවත අපේක්ෂාවෙන් සිට ඇතිබව හා එය නො ලැබීම නිසා උන්වහන්සේට පක්ෂපාත ඇති ඇතැම් ගිහි

පැවිදි පිරිස් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් ඔස්සේ මෙන්ම සමාජ මාධ්‍යයන්හි දි සංඝ සාමාග්‍රිය පළුදු වන ස්වභාවයෙන් සිටපු කුලපති ස්වාමීන් වහන්සේට පක්ෂපාතිව ඒක පාක්ෂිකවූ, අසාධාරණ කරුණු පළකරන්නට වීම අතිශය කණගාටුදායකය. එය නොවිය යුත්තකි.

අළුයම ලූ කෙළ පි!ඩක් සේ තනතුරු තානාන්තර අතහැරීමටත් සාධාරන පසුබිමක් යටතේ තනතුරු භාර ගැනීමටත් මා සූදනම්ය. මා කිසිවිටෙකත් තනතුරු ලෝභයෙන් කටයුතු කොට නැත. තමාගේ ශක්ති පමණින් සේවාවන් සිදු කිරීමට තනතුරු අවශ්‍ය නො වෙයි. ඳින් පුරුදුවී සිටින්නෙමු.

ඔබගේ පත් කිරීම් ලිපියට අනුව මා භාරගත් රජරට විශ්වවිද්‍යාලයේ කුලපති ධුරය යම් පාර්ශවයකගේ සිත් තැවුලට හෝ භේදකාරී මත ගොඩනැගීමට හෝ අප අතර පැවතිය යුතු සංඝ සාමග්‍රිය බිඳවැටීමට හෝ හේතු වන්නේ නම් එම තනතුරට වඩා අප අතර පවතින සංඝ සාමග්‍රියම මම උතුම් කොට සළකන්නෙමි.

"සමග්ගා හෝථ මා විවදථ" යන බුද්ධ වචනයට මාගේ ගෞරවය පුදකරමින් ඔබ විසින් මා වෙත පත් කරන ලද කුලපති තනතුරෙන් ඉල්ලා අස්වන බව මෙයින් දන්වා සිටිමි.

තනතුරු පිළිගැනීමටත්, තනතුරු අත්හැරීමටත් අපි පුරුදු නොවන්නේ නම් අත්හැරීම පුරුදු කරන්නයැයි හෝ භව තණ්හාවෙන් මිදෙන්න යැයි අපි සමාජයට බණ කීමෙන් පළක් නොවන බව මා තේරුම්ගෙන සිටින බවද කරුණාවෙන් දන්වා සිටිමි.

ඔබට දිගාසිරි වේවා

මෙයට,

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගල්ලෑල්ලේ සුමනසිරි ස්ථවිර

මොලගොඩ කොටමුදුන්ගල රජමහා විහාරාධිපති
පූජාපිටිය ශාසනාරක්ෂක බලමණ්ඩලයේ ලේඛකාධිකාරී
මහනුවර දිසා ශාසනාරක්ෂක මණ්ඩලයේ ලේකම්
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙහි
හිටපු උපකුලපති, අග්ගමහා සද්ධම්ම ජෝතිකධජ,
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
ආචාර්ය ගල්ලෑල්ලේ සුමනසිරි ස්ථවිර